
මහතලා පුර යාත්‍රාව
(පළමු අදියර)
ආර්.බී.ටී.එස්.රාජසිංහ

# මහතලා පුර යාත්‍රාව

(පළමු අදියර)

කතෘ : ආර්.බී.තිසරි සෙනාරා රාජසිංහ

වෙනත් කෘති : බීවර් ගුහා චාරිකාව

කෘතිය පළ කළ දිනය : 2025 - 02 – 08

ISBN : 978 - 624 - 208 - 815 - 0

වර්තමානයේ නාගරීකරණයට
යොමු වූ දරුවන්ගේ ලෝකය ගැමි
ජීවිතයේ රසාස්වාදය කෙරෙහි
යොමු කිරීමට සිතුවිල්ලකින් හෝ
වෙර දරන සියලුම හිතවතුන්ටත්
කලණ මිතුදමෙහි නියම අරුත
විදහා පාමින් ජීවිතයේ ආලෝකය
සොයා යන්නන්ටත් මාගේ අකීකරු
පන්හිදෙන් අපූරු රටා මැවුමට
උපකාර කරනා සියලුම දෙනාටත්
මේ ග්‍රන්ථය උපහාරයක්ම වේවා!..

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# 01.

'' පොඩි බේබි නැගිටින්න.''

'' හ්ම්ම්.. නිදාගන්න දෙන්න සිරි..''

'' අහ් එහෙම කියල කොහොමද බේබි! අද නේද ඉස්කෝලෙ නිවාඩු දෙන දවස?''

අනේ දෙවියනේ ඇත්තට අද නේන්නං ඉස්කෝලෙ නිවාඩු දෙන දිනේ. දනිපනි ගා අවදි වූ මම සිරී ගෙනත් දුන්නු කිරි වීදුරුව ස්ටූල් එක මත තැබුවෙමි. වහා ම ගොස් වේලාව බැලූ මා යලි පැමිණ කිරි වීදුරුව ම හිස් කළේ ඉක්මනින් මුහුණ සේදීමට යා යුතු නිසා යි. මා හට උදේ පාසල් යාමට සූදානම් වීමට යන්නෙ උපරිම පැය බාගයකි. හනි හනික ලක ලැහැස්ති වූ මම පහළ තට්ටුව වෙත පඩිපෙළේ වේගයෙන් ඇදී ආවෙමි.

'' අහ් අද එක්කෙනෙක් කවදාවත් නැතුව කලින් ලැහැස්ති වෙලානේ.''නෝක්කාඩු හිනාවක් සමගින් උදේම මට ඇනුම් පදයක් කීවේ මොනවා උනත් මට පණ මෙන් ආදරය කරන මගේ එක ම සොයුරිය අක්කා යි.

'' කෝ එන්න පුතේ අද නම් උදේට කාලා ම යන්න ඕනි''මාවත් අක්කාවත් කෑම මේසය වෙත කැඳෙව්වේ අපේ අම්මා යි.

'' ඔන්න හොදට අහගන්න අද අපි හරියටම දහය වෙද්දි ඉස්කෝලෙට

එනවා.රැස්වීම තියෙන්නෙ දහයහමාරට නේද?"තාත්තාද කෑම මේසයේ ඉදගනිමින් අක්කාගෙනුත් මගෙනුත් විමසුවේ ය.

"ඔව් තාත්තා.. තාත්තා එන්නෙ මල්ලිගේ පන්තියට ද මගෙ පන්තියට ද?'' මටත් කලින් අක්කා තාත්තාගේ ප්‍රශ්නයට පිළිතුරකුත් ඒත් සමග ම තවත් පැනයකුත්  ඉදිරිපත් කළා ය.

'' දැන් මන් කාගේ පන්තියට ද එන්න ඕනි?'' තාත්තා එය නම් විමසුවේ මගෙන් බව මට වැටහුණි. නමුත් ආ පිට පිළිතුරක් දීමට නොහැකි වුණි. නිසැකව ම කවුරුන් හෝ පැමිණෙනවානේ, අම්මා නැතිනම් තාත්තා එනිසා මට කිසිම විශේෂයක් එහි නොවී ය. එහෙත් අක්කා නම් කැමති වූවේ ඇයගේ පන්තියට තාත්තා පැමිණෙනවාට යි. අද පාසලේ නවය ශ්‍රේණියේ පළමු වාරය අවසන් වී නිවාඩුවත් , එම වාරයේ වාර විභාගයේ ලකුණු සමග පන්තියේ වෙනියාත් ලබා දෙයි.ඒ සදහා පළමු වාරයේ දෙමාපිය හමුව ද අදට යෙදී තිබුණි.මම මෙවර විභාගයට නම් වැඩිය පොතපතේ පාඩම් වැඩ නොකළෙමි. එහි ප්‍රතිඵල නොඅඩුව උණු උණුවේ ලැබෙනු නියතය.

'' ඒවා ඉස්කෝලේ දී බලමුකෝ. දැන් කට්ටියම කාලා ගියා නම් හරි'' ඒ මොහොතේ මාගෙ  නිහඬ බව බිදීමට අම්මා පැමිණියා ය.

ඉන්පසු මාත් අක්කත් ඉක්මනින් රෝස් කර තිබූ පාන් පෙති කිහිපයක් මාගරින් සමග කටට දෙකට ගිල දැමුවෙමු. සුළු මොහොතකින් තාත්තා වාහනය පණ ගැන්වූවේ අපට වහා පැමිණෙන ලෙස සංඥාවක් ද කරමිනි.අම්මාට සමු දුන් අපි කාරය වෙත නැගී පාසල වෙත ගියෙමු.

" ගුඩ් මෝර්නින්ග් දේශාන්" මා මෙසේ පැවසූ විටදී එක පෙලට මාගේ මිතුරු කැළ මදෙස පුදුමයෙන් බැලූහ.

"අහ් අදනම් වහී වගේ."අරලියගහ යට තිබුණ පඩිපෙළේ බැම්මේ සිටි විකුම් එයින් බිමට පනිමින් කිව්වේය.අනෙක් සියල්ලෝ ද එය අනුමත කළහ.

"ඒ මොකද එහෙම කියන්නේ?" හැමදෙනාගේම මේ අමුතු හැසිරීම මට ඒ තරම් ඇල්ලුවේ නැත.

"ආයෙත් අහල අද ඔයා කලින්ම ඉස්කෝලෙටට ඇවිල්ලා.වෙනදට බෙල් එක වදින්න විනාඩි දෙක තුනකට කලින් එන ඔයා, අද හත වෙන්නත් කලින්ම ඇවිල්ලා." නිතරම මාගේ පැත්ත ගන්නා මාගේ අඹ යාලුවා වූ රුවන් අද වෙනත් යහළුවන් සමග මා හට නෝක්කාඩු කියයි.ඒ මොහොතේ නම් මට එතනින් කිසිවක් නොකියා පිටව යාමටද සිතුනි.එහෙත් එය එතරම් සුදුසු දෙයක් නොවේ යැයි මම ඒ මොහොතේ වටහාගෙන ඔවුන් ඉදිරියේ මද සිනහවක් පෑවෙමි. එයින් පසු අපි සෑම පාසල් සීනුව වදින තුරු බොහෝ දේ කතා කළෙමු.සීනුව වැදෙනවාත් සමගම අපි එක පිම්මට දිව ගියේ පංතිය වෙතටයි.

අද පන්තියේ ළමයි එක්අයෙක්වත් අඩු නොවීය.සියලු දෙනාම පැමිණ සිටියහ.ආගමික වතාවත් වලින් අනතුරුව සුපුරුදු පරිදි පන්තිභාර ගුරුතුමියට ආයුබෝවන් කියූ අපි ඇය නාම ලේඛනයේ පැමිණීම ලකුණු කරන තුරු අපගේ සහයෝගය ඇයට ලබා දුන්නෙමු. කාලය ගෙවී යනු නොදැනුණි.පන්තිභාර ගුරුතුමිය අපට පන්තිය දෙමාපිය හමුවට සූදානම් කරන්නට පවරා කාර්යාලයට ගියේ යම්කිසි රාජකාරියක් සඳහායි. අපි පන්තිය සුපුරුදු පරිදි හොඳාකාරව සූදානම් කළෙමු. එයට පිරිමි ළමුන්

මෙන්ම මෙන්ම ගැහැණු ළමුන්ගේ ද සහයෝගය උපරිමයෙන් ලැබුණි. අපගේ පාසල මිශ්‍ර පාසලක් වූ බැවින් අපට යෙහෙළියෝ බොහෝමයක් සිටියහ.ඔවුන් සමග නිතරම රණ්ඩු සරුවල් කරගත්තත් ඔවුන් අපේම සොයුරියන් බඳු විය.

හදිසියේම විදුහල්පතිතුමාගෙන් නිවේදනයක් ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ඇසුණි.එලෙස නිවේදනයක් ඇසෙනවාත් සමඟම මුළු පාසලම නිශ්ශබ්දවෙයි.එහි කියවුණේ දෙමාපියන් පැමිණෙනතුරු සියලුම සිසුන්ට පන්ති කාමර වලටම වී සිටින ලෙස කරන නිවේදනයයි. අපි සියලු දෙනාම රැඳී සිටියේ නොඉවසිල්ලෙනි.ඒ අතරතුර කනිෂ්ඨ හා ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක නායිකාවන් පිළිවෙලකට අදාළ පන්ති කාමර වෙත යොමු කිරීමට කටයුතු කළහ.

සුළු මොහොතකින් අපේ පන්ති කාමරයට ද මිතුර මිතුරියන්ගේ දෙමව්පියන් පැමිණෙනවා අපි දුටුවෙමු. ඒත් සමගම තාත්තාත් සිනහවෙමින් නොනවතින ආකාරයේ කතාවකින් කාත් සමඟදෝ පැමිණෙනවා මම දුටුවෙමි. ඒත් සමග මට එහා පැත්තේ පුටුවේ සිටි රුවන් ,"අන්න අපේ අප්පච්චිත් එනවා...

ඔයාගේ ගෙදරින් තමයි නැද්ද...... ?"

" නෑ නෑ අන්න අපේ ගෙදරිනුත් එනවා.ඒත් මං බැලුවේ අපේ තාත්තා අර කාත් එක්කද කතා කර කර එන්නේ කියලා."ඇතින් එන තාත්තාගේ ඇඳුමේ හැඩරුව කී විට ඔහු කීවේ,

" ඒ කියන්නේ අර ඉන්නේ ඔයාලගේ තාත්තා,එතකොට එයාට එහා පැත්තෙන් ඉන්නේ අපේ අප්පච්චි නේ!"

"අපි දන්නෙ නැතුව අපේ තාත්තලා අඳුරනවද!"

" හ්ම්! ඔයාලගේ තාත්තා අපේ ඉස්කෝලේ ඕල්ඩ් බෝයි කෙනෙක්ද ?"

" ඔව්නේ රුවන්! එතකොට ඔයාලට තාත්තත් මේ ඉස්කෝලෙද හිටියේ?"

" ඔව්නේනම් "

මට දැනුණු සතුට නිම් හිම් නැති විය. මාගේ හොඳම යහළුවාගේ තාත්තායි, අපේ තාත්තායි යළුවෝ. මට හැඟුනේ එයින් රුවන්ගේත් මගේත් මිත්‍රත්වය තවත් ශක්තිමත් වේවි කියායි.

රුවන් ශිෂ්‍යත්වයෙන් අපේ ඉස්කෝලෙට එන්න කලින් ඉඳන්ම මම මේ ඉස්කෝලේ උගත්තෙමි.එවිට ද මට හොඳම යහළුවන් බොහෝ දෙනෙකු සිටියහ.ඒ හොඳම එයාලුවන් සියලු දෙනාම තවමත් ඒ අයුරින්ම මාත් සමඟ සිටිති.එහෙත් ශිෂ්‍යත්වයෙන් පසු රුවන්ගේ පැමිණීමත් සමඟ  මට නව ජීවයක් ලැබුණු බව නිසැක ය.පෙර අධ්‍යාපනයට වැඩි උනන්දුවක් නොදක් වූ මම රුවන්ගේ කීම නිසාම අධ්‍යාපන කටයුතුවලට බලෙන්ම ඇබ්බැහි උනෙමි.ඒත් සමගම පන්තියේ වෙනියා අතින් ගත්කල පහළව දහසය වූ මම අට ශ්‍රේණියේ තුන්වන වාරයේදී පංතියේ දෙවෙනියා  වූවෙමි.පන්තියේ පළවෙනියා වූයේ රුවන්ය .ඒ ලකුණු පහක පරතරයකිනි.මේ වාරයේ මා එතරම් පොතපතේ පාඩම් වැඩක් නොකළෙමි.එහෙත් ප්‍රශ්න පත්තරවලට හොඳින් පිළිතුරු සැපයූවා යැයි මතකයක් මා හට තිබේ.

විනාඩි දහයක් පහළොවක් යාමට මත්තෙන් අපගේ පන්ති කාමරය දෙමව්පියන්ගෙන් පිරී ගියේය.රුවන් සහ මා දුටුවේ  ඔහුගේ තාත්තා සහ මාගේ තාත්තා දුර සිටි අප දෙදෙනාව අඳුනාගෙන අපදෙනා පිළිබඳව කතාබස් කරන ආකාරයයි. අපගේ අනිත් යහළුවන්ගේ ද දෙමව්පියන් පැමිණීමෙන් අනතුරුව පන්තිභාර ගුරුතුමියද පන්ති කාමරය වෙත පැමිණියාය.

ගුරුතුමිය සභාව ආමන්ත්‍රණය කරන්නට වූවාය. එය දිගු දේශනයක් විය. දේශනය අවසානය වන විට ඇය පන්තියේ වෙනියා පැවසීමට සූදානම් වූවාය.

"අපි පංතියේ පළවෙනි වාර විභාගයෙන් ප්‍රථමස්ථානය ,දෙවන ස්ථානය සහ තෙවැනි ස්ථානය ලබාගත් ළමයින් කවුද කියලා අපි දැන් බලමු. මේ ලකුණු එක්දාස් දෙසීයෙන් ලකුණු එක්දහස් එකසිය තිස් හතරක් ලබාගෙන පන්තියේ තෙවන ස්ථානය ලබාගෙන තියෙන්නේ සිතුමි දූලන්යා නවරත්න සිසුවියයි." එක්වරම අත්පොළ සන්නාදයක් නැගුණි. මගේ හෘද ස්පන්දන වේගය වැඩිවෙන ශබ්දය මට ලාවට මෙන් ඇසුණි.

හැබැවටම මම පන්තියේ වෙනියා පිළිබඳව වැඩි තැකීමක් නොකරන්නෙමි. එහෙත් මගේ මිත්‍රයා රුවන් කියනා නිසාම මම පාඩම් වැඩ කටයුතු හොඳින් කරන්නෙමි. ඔහු මේ වාරය ආරම්භ වෙත්ම පන්තියේ මම පළමුවෙනියා විය යුතුයි යැයි මාව පොරොන්දු කර ගත්තේය. මා ඔහුට වූ එම පොරොන්දුව කඩ කිරීමට මගේ සිතේ කිසිදු බලාපොරොත්තුවක් නොවීය.එම නිසාම යළි යළිත් ගුරුතුමියගේ එම දේශනයේ අතුරුඑල චිත්‍රපටයක දර්ශනයක් වන මගේ යටි හිත මට මවා පාන්නට කටයුතු කළේය.

සිතුමි(මෙවර අපේ පංතියේ තුන්වෙනියා)පන්තිභාර ගුරුතුමයට වැඳ ආචාර කොට ඇයගේ ප්‍රගති වාර්තාව ලබාගත්තා ය.

"බොහොම හොඳයි,මෙවර අපේ පන්තියේ දෙවෙනි ස්ථානයක් අහිමි වී ගොස් තිබෙනවා. එයට හේතුව තමයි මේ පාර අපේ පන්තියේ පළවෙනියෝ දෙන්නයි."

මම එක්වරම රුවන් දෙස බැලුවේ ඔහුගේ මුවේහි ඒ මොහොතේ දැක්වෙන ප්‍රතිචාරය බැලීමටයි. ඔහු එක්වර ම මදෙස බැලුවේ ඔහුටත් අවැසි වී

තිබුණේ මගේ ප්‍රතිචාරය බැලීමට නිසාවෙනි.

" ලකුණු එක්දහස් දෙසියයෙන්,එක්දහස් එකසිය හැට අටක් ලබාගනිමින් මෙවර රුවන් සේනානායක සහ නවීන් වීරසිංහ සිසුන් දෙදෙනාම ප්‍රථම ස්ථානය ලබා ගන්නවා."

මට දැනුනේ මාව ගිනි කබලකට වැටුනා සේය. රුවන් සහ මම ඉඳගෙන සිටි අසුන් වලින් නැගිට්ටෙමු. පළමුව මමත් ඉන්පසු රුවනුත් ගුරුතුමියට වැඳ ආචාර කොට අපගේ ප්‍රගති වාර්තා ලබා ගත්තෙමු. යළි පැමිණ මමත් රුවනුත් අපේ පුටුවලින් ඉඳගත්තෙමු.

සාමාන්‍යයෙන් අපගේ පන්තියේ ඉගෙනීමට වැඩිපුරම දක්ෂ ගැහැණු ළමයින් සහ පිරිමි ළමයි පන්තියේ දසදෙනා අතරට එනවා නො අනුමායනය.ඒ අතර මාගේ මිතුරු කැළත් අනිවාර්යයෙන්ම සිටිති. මෙවර පන්තියේ හතරවන, පස්වන, හයවන, හත්වන ස්ථාන ලකුණු දෙක තුනක පරතරයක්ද ඇතිව ලබා ගත්තේ මගේ මිතුරන්ය.

සයදෙනෙකුගෙන් සැදුම්ලත් අපගේ කල්ලිය පන්තියේ වෙනියා අතින් ගත්කල මෙන්ම අනෙක් සියලු බාහිර වැඩ කටයුතු වලදී පෙරමුණ ගත්තෙමු. තවද අපි ලෙහෙසියෙන් ගැහැණු ළමයින්ට පන්තියේ වෙනියා අතින් ඉදිරියට පැමිණීමට නොදෙන්නෙමු.එය අප සිතා මතා කරන්නක් නොවේ. සාමාන්‍යයෙන් වැඩි පාඩම් කටයුත්තක් නොකළද වාර විභාගයේදී අන් අයට වඩා අපේ කල්ලියේ සොයුරන්ට ලකුණු වැඩිවීම සාමාන්‍ය දෙයකි.

එක් එක් විෂය භාර ගුරුතුමිය පැමිණ පැවැත්වූ දේශන අතරතුරදී අපිට එක් එක් විෂයන්ගේ ලකුණුද ලැබුණි.ඉන්පසු රැස්වීම කෙමෙන් අවසානය කරා

ළඟා වුණි. මා සිටියේම කාලය ඉක්මනින් ගෙවී යනවා නම් හොඳයි යන මතයේ ය.ඒ වුනත් මාසයක කාලයක් ගෙදර තනියම ඉන්න ඕන කියන එකත් මගේ ඔළුවේ නොතිබුනාම නොවේ. අක්කා සිටියාත් ඇයටත් බොහෝම වැඩ කටයුතු තිබේවි. එම නිසා මම ඒ කාලය පුළුවන් උපරිමයෙන් මගේ කල්ලියත් සමඟ හින්සිහිරුවේ කතා බහ කරමින් සතුටින් ගෙවා දැමුවෙමි. රැස්වීමේ අවසානය කරා ළං වෙත්ම මගේ ඔලුව යකාගේ කම්මල බඳු විය. තවත් මාසයක් කොහොම ද තනියමම ඉන්නේ? යහළුවන් මුණ ගැහෙන්නෙත් නැහැ! හිස් කාලච්ඡේද වල සිංදු කියන්නත් නැහැ!

ඉන්ටවල් එක වෙලාවට පිට්ටනයේ ක්රිකට් ගහන්නත් නෑ! මේ වගේ විකාර ගොඩකින් මගේ ඔළුව ඒ වෙලාවේ පිරී තිබුණි. මගේ පුංචි වෙනසක් වුණත් ඉක්මනට මගේ යාළුවොන්ට අඳුර ගන්න පුළුවන් අපූරු හැකියාවක් ඔවුන් සතු විය. එහි ප්රතිඵලයක් විදිහට ,

"ඒ බං! මේ උඹට කතා කරන්නේ"

" නවීන් මොකද මෙ වෙලා තියෙන්නේ ?"

" මොකද නිවාඩු කාලය කරන්න තියෙන වැඩ ටිකවත් ප්ලෑන් කරන ගමන්ද?"

" ඔව් බං. මට හිතාගන්න බැරි මේ පාර නිවාඩුව කොහොම ගෙවලා ඉවර කරන්නද කියලා. රුවන් යනවා එයාලගේ ගමේ; විකුම් යනවා මාසෙක ටුවර් එකක් ; දේශාන් යනවා හපුතලේ ෆාම් එකට; එතකොට ජනිතුයි විහඟයි යනවා පොළොන්නරුවේ. මං විතරක් වේළි වේළි කොළඹ ඉන්න එපැයි."

"හරි හරි මේ පාර නිවාඩුවට අක්කලත් එක්ක ඔයත් කොහේ හරි යන්න."

" අන්න ප්රශ්නෙ ඉවරයි නේ.."

ඒ ජනිත් සහ දේශාන්ගේ අදහස්. නිතරම නිහඬව සිටින රුවන් කිසිවක්

නොපවසා කල්පනා ලෝකයක ගිලී සිටියේය. රැස්වීම අවසන් වන විට අපි සියලු දෙනාම පෙළ ගැසී බුලත් අතක් බැගින් රැගෙන පන්තිභාර ගුරුතුමියටත් අනික් විෂය භාර ගුරුවරුන්ටත් වැඳීමට ගියෙමු. ඒ අයුරින් සියලු වැඩ කටයුතු හමාරවීමෙන් පසුයි අපිට අපගේ දෙමාපියන් අසලට යාමට ඉඩ සැලසුණේ.

"පුතා අඳුර ගන්න, මේ මගේ ඉස්කෝලෙ කාලේ ඉඳන් ම හොඳම යාළුවා,ජගත් අංකල්"

අපේ තාත්තා මට රුවන්ගේ තාත්තව හඳුන්වල දුන්නේ අන්න ඒ විදිහටයි.තාත්තල දෙන්නා ලොකු කතාවක රුවනුයි මායි හිටියේත් හර බර කතාවක.

"මේ පාරේ අපේ කුඹුරේ අස්වනු නෙලනවා.නවීන් මීට කලින් දැකලා තියෙනවාද අස්වනු නෙලනවා?"

" හපොයි නෑ රුවන්.කොළඹ මොන කුඹුරද? කුඹුරු තිබුණත් තියෙන්නේ අපේ ගෙවල් පැතිවල නෙවෙයිනේ.ඒක නිසා මං කවදාවත්ම කුඹුරක ඇවිදලාවත් නෑ."

"ඒ වුනාට මේ පාර නම් නවීන්ට අනිවාර්යෙන්ම කුඹුරක් බලන්න එන්න පුළුවන් වෙයි."

"ඒ කිව්වෙ?"

" ඔයාට ඇහුන් නැද්ද මෙතනදි තාත්තා කතාවෙච්චි දේවල්!"

" ලාවට එහෙ මෙහෙන් ඇහුන. ඒ උනාට ඉතින් අපි කට්ටියත් ලොකු කතාවකට හිටියේ."

" හරි හරි එහෙනම් නවීන්ට ඒක පස්සෙම දැනගන්න පුළුවන් වෙයි."

" දැන් ඕක කියලා දාන්න.කුතුහලය අවුස්සලා දාලා පස්සේ දැන ගන්න

පුළුවන් වෙයි කියලා හරියනවා ද?"

මං කිවූ දේ තඹ සතයකට මායිම් නොකෙරූ රුවන්,මට උදේ අක්කා විසින් හෙලූ නොක්කාඩු සිනහවම දැම්මේය. මගේ පොඩි දේටත් කිපෙන සුළු ක්ෂණික කෝපය නිසාම නොඉවසුම් බැල්මක් හෙලා මම එතනින් පිටව ගියෙමි.එවිට මා පසුපස හඹා ආ රුවන් මගේ පිටට තද පහරක් ගැසුවේ ය. එම පහරේ වේගයට පසෙකට තල්ලු වී ගිය මම රුවන් දෙස බැලුවේ කෝපයෙනි.එහෙත් එම කෝපය ක්ෂණික තුරන් වී ගියේ ඔහුගේ හිනාව නිසාය. ඔහු මාගේ හැබෑම මිතුරායි. මා හට මේ අයුරින් හොඳම යාලුවෙක් කිසිදු දින මුණගැහී නැත.එම නිසාම යළි ඔහු අසලට පැමිණි මම ඔහුගේ කරට අතක් දැම්මෙමි. ආපිට ඔහුද මගේ කරට අතක් දැම්මේ ය.ඉන්පසු අප දෙදෙනා යළි තාත්තලාව මුණගැහෙන්න කියමු. ඔවුහු එවිට ප්‍රධාන ගේට්ටු අසලට පැමිණෙමින් සිටියහ. ඒ මොහොතේ අම්මා සහ අක්කාත් එතන සිටියේ අප පැමිණෙන තුරුයි.

එතනට ගිය වහාම අපේ තාත්තා විසින් රුවන්ගේ තාත්තාට අපේ අම්මාවත් අක්කාවත් හඳුන්වා දුන්නේ ය. අම්මා, තාත්තා සහ රුවන්ගේ තාත්තා කෙටි කතා බහක යෙදෙන අතරතුරදී අක්කා පාසල් ගේට්ටු අසල සිටි ඇයගේ යහළුවන් හමුවීමට ගියා ය. මා රුවන් දෙස බැලූ නමුත් ඔහු කල්පනාවක සිටි බැවින් මම ඔහුව අසලට ගියේ ඔහුව කතාවට අල්ලා ගැනීමටයි.

" මොකද මොකද මේ බර කල්පනාවකට බැහැලා?..." මම රුවන්ගේ පිටට තට්ටුවක් දමමින් ඇසුවෙමි.

" නෑ නවීන්, මං මේ කල්පනා කරේ...නෑ එක්කෝ දැන් ම ඕනෙ නෑ." රුවන් සාමාන්‍යයෙන් මා හට කිසිවක් නොපවසන්නකු නොවේ. එහෙත් ඔහුගේ මේ මොහොතේ තිබුණු හැසිරීම, ඔහු යමක් මගෙන් සඟවනවා යැයි මා හට හැඟෙව්වේ ය. ඒත් ඔහොමගින් යමක් සඟවනවා නම් එයට යම් කිසි

හේතුවක් තිබිය යුතු නිසා මම තවත් ඔහුගේ මේ හාර හාරා නොඇසුවෙමි.

"පුතාලා අපි දැන් යමු නේද?" අපේ අම්මා මගෙනුත් අක්කාගෙනුත් ඇසුවා ය. ඉන්පසු අම්මා දෙස බලා "හා" යැයි කීමට ඔලුව වනා රුවන් දෙස හැරෙත් ම මුවින් මද සිනහවක් පහල කළ ඔහු මට පුංචි පොතක් තිළිණ කළේ ය. එය පුංචි පොතක් නොවෙයි! ඒ මගේ ප්‍රගති වාර්තාවයි.

" ඔයාට මේක අමතක වෙලා, මගේ පොරොන්දුව රැක්කට තැන්කියු යාලුවා."

" හ්ම්ම් තැන්කියු... "

" ආ නෑ මේ පොඩ්ඩක් වැරදුනා දන්නේ නැද්ද ඉතිං ආය චුට්ටක් වැරදුනා... "

රුවන් අපේ හොඳම යාළුවෙක් වෙච්ච පළවෙනිම කාලෙදි එයා අපිට හොඳම යාළුවෝ හතරේ "ස්තුතියි ,සමාවෙන්න " වගේ දේවල් තියෙන්නෙ හොඳ නැහැ කියා කියා දුන්නේය . මේ මොහොතේ ඔහුට ඔහු එදා කිව් දේ අමතක විය .

ඉන් පසුව රුවන්ටත් ඔහුගේ තාත්තාටත් සමුදුන් අපි නිවස කරා පැමිණියෙමු. ඔහුත් ඔහුගේ වාහනයට නැගෙනවා අපි දුටුවෙමු.ඉන් පසු මම කාරයෙන් එළියට ඔලුව දමා ඔහුට අත වෙනුවෙමි. ඔහු ද ඔහුගේ

වාහනයෙන් එළියට ඔලුව දමා මාහට අත වෙනුවේය. මා පෙර කියූ පරිදි ඔහු මගේ හොඳම මිතුරා පමණක් නොවේ. හැබැවටම මට සහෝදරයෙක් බඳුය. එම නිසා ටික වේලාවක් කාරයේ නැගී ඉදිරිය බලා ගමන් කළ මට, අනේ තව කොච්චර කාලෙකට පස්සෙද මට මගේ යාලුවන්ව මුණ ගැහෙන්නෙ? මාසයක්ම තනියම ඉන්නත් එපැයි? කොහොමද ඒ කාලේ ගෙවලා දාන්නේ? යැයි යළි යළිත් අර පිස්සු විකාර ඔළුවට ආවේ ය. ඒ කල්පනා ලෝකයට ගිලී

මම රුවන් කිව් එක් දෙයක් ගැන සිතුවෙමි. ඔහු කියූ පරිදි ඔවුන්ගේ කුඹුරේ මෙම මාසය තුළදී අස්වනු නෙලනු ඇති. ඒ වෙලාවේ මෙන්ම වාහනේ ගමන් ගත් වේලාවෙදිත් මා කල්පනා කළේ කුඹුරක අස්වනු නෙළන මොහොත දැකගැනීමට ඇත්නම් කියායි. යලි යලිත් යම් යම් දේ සිතමින් ගිය මට අපගේ වාහනය නිවස තුළ නවත්වන තුරුම නොදැනුණි.

කාරයෙන් බැස මම කෙලින්ම දූවගොස් රැයක් දවාලක් නොතකා ස්නානය කළෙමි. ඉන්පසු යලි පැමිණ මුළු ගේ වටේම ඇවිදිමින් එක එක්කෙනා කරන්නාවූ වැඩවලට උදව් කර යළි පැමිණ ඔබට මේ ඉදිරිපත් කරන්නා වූ පොත අද දවසේ  ආරම්භ කළෙමි.මේ මොහොතේ මා සිටින්නේ මගේ පාඩම් මේසය මත මෙම පත්රිකාවද තබාගෙන ඔබ වෙත මගේ අදහස් ඉදිරිපත් කරමිනුයි. අද දිනයේ සිදුවූ මේ සියල්ල මගේ සිතට අමුතුම ප්රශංසාවක් ගෙනදුනි. මන්ද යත් මම පන්තියේ පළවෙනියා වූ ප්රථම අවස්ථාව මෙයයි. ඒ සතුටට බෙදා ගැනීම සඳහා මම දැන් පහළ තට්ටුව වෙත යන්නෙමි. එසේ නම් අදට නවතිමි. හෙට දිනයෙන් යළිත් හමුවෙමු.

# 02.

සාමාන්‍යයෙන් වෙනදා ටිකක් කලින් උදෙන්ම අවදිවන මා අද දිනයේ අවදි වූයේ ටිකක් පමා වීමෙනි. සිරි එනම් අපගේ නිවසේ වැඩට උදව් කරන පුද්ගලයා, කෙසේ වෙතත් ඔහු අපේ නිවසේ සාමාජිකයකු බවට පත්වී අවසන්ය. නිතරම පාහේ අපගේ වැඩ කටයුතු වලට උදව් වෙන ඔහු හරි විහිළුකාරයකි. මා හඳුනන්නන් අතරින් මා ප්‍රිය කරන ම ආකාරයේ විහිළු කරන්නා මොහුය. ඔහු විසින් අද දිනයේදිත් මට කිරි වීදුරුව ස්ටූල් එකෙන් තබා මා අවදි නොකරම පහළට ගොසිනි. ඉන්පසු මුහුණ සෝදා කිරි වීදුරුව ම බී මම පහළ තට්ටුව වෙත පැමිණියේ උදෑසන ආහාරය ලබා ගැනීමටයි.

හපොයි දෙවියනේ! ගෙදර හැමෝම කොහේ හරි යන්න ලැහැස්ති වෙනවා මම දුටුවේ එවිටයි.

" අම්මා මොකද මේ ? කොහේ හරි යන්න ලෑස්ති වෙනවද?"

" හා ඔයා ලෑස්ති උනේ නැද්ද! ඉක්මනට ගිහින් ඇඳුමක් දාගන්න."

"කොහෙ යන්නද මේ ලෑස්ති වෙන්නේ?... අනේ අම්මා කියන්නකෝ"

" අර ඔයාගෙ යාළුවා රුවන් අන්න එයාලගෙ දිහා යනවා"

" මරු යාලුවා. යාළුවගේ ගෙදර යනවා කියලවත් දන්නැති යාලුවෙක් නේ අනේ මේ.හූයියා"

"අනේ අක්කා මේ කටවහන් ඉන්නකෝ! ඔයාලා මෙතන මට කියන්නැතුව

යන්න ලෑස්ති වෙලා දැන් මෙතන එනවා මට හූ ගාගෙන."

අදහා ගැනීමටත් නොහැකි අයුරින් මා විස්මයට පත්වුණි.ඒක නේන්නං රුවන් මට කිව්වේ. මේ පාර කුඹුරු අස්වනු නෙළෙනවා මටත් බලන්න පුළුවන් වෙයි කියලා.

හනි හනිකට ලක ලෑහැස්ති වූ අපි සිරීට සහ ලලිතාට නිවස බාර දී වහාම මාතලේ කරා ගමන් නැරඹුවෙමු. බොහෝ දුර කතර ගෙවාගෙන අපි වාහනේ ගමන් කළෙමු.මා හට ගමනේ වැඩි දෙයක් මතක නැත.ඒ මට නින්ද යාම නිසයි. වාහනයක උනත් ගමන් කිරීමෙන් ගමන් මහන්සිය ඇති වෙනු නියතය. එම නිසාම මා සිටියේ දැඩි වෙහෙසකිනි. මාතලේට යන අතරමගදී කිසිදු විශේෂයක් නම් නොවීය.දේශගුණික විවිධත්වය නිසාමද මන්දා කොළඹ තරම් රස්නයක් මා හට මාතලේට ළංවෙත්ම නොදැනුනි.අපගේ වාහනේ ඒසීකර තිබුණ නමුත් අපි එදින වාහනේ ජනේල හැරදමා මද පවනේ සිසිල වින්දෙමු. වැඩි දුරක් යාමට මත්තෙන් මා කියූ පරිදි නින්ද ගියේ මාහටත් නොදැනීමයි.

පැය දෙකහමාරක පමණ තද නින්දකට වැටුණු මම දුටුවේ හරි අපූරු සිහිනයක් බව මා හට ලාවට මතකය. මා කෙතරම් වෙර දැරුවද එය මතක තබා ගැනීමට මා හට නොහැකි වුණි.

මා අවදි වූයේ වංගු සහිත මාර්ගයක ගමන් කරන අතරතුරදී ය.

" ගුඩ් මෝනින්ග් නිදි කුම්බරයෝ!" අක්කා පිටු පස අසුනේ සිට මගේ මුහුණ මිරිකුවා ය.

" ආව්... මල වදේ !..."

" හා... ඒක යසයි දැන් කොහෙ හරි යද්දිත් රණ්ඩු වෙන්න පටන් ගත්ත ද?" හිනාවකින් මමත් අක්කාත් අම්මා ඇසූ පැනයට පිළිතුරු දුන්නෙමු.

" තාත්තා, අපි දැන් කොයි හරියෙද ඉන්නෙ?" මම වට පිට බලමින් ඇසුවෙමි.

"කිව්වට නම් පුතා දන්නෙ නැතුව ඇති...මේ හරියට කියන්නෙ බලකඩුව කියලා."තාත්තා කිව්වේ ය.වංගු සහිත මාර්ගයකි. එක් පසෙකින් අප ගමන් ගත් මාර්ගය සහ තවත් පසෙකින් විශාල සානුවකි. තාත්තාගෙන් අසා

දැනගත් පරිදි එය බලකඩුව සානුවයි. කෙසේ වෙතත් එක් ස්ථානයකින් අපි වංගු සහිත මාර්ගයෙන් වෙනත් අතකට හැරෙවුනෙමු. ඉන්පසු වාහනය පසෙකින් නැවත වූ තාත්තා,

" එන්න කට්ටිය එළියට බැහැලා පොඩ්ඩක් මේ හරියේ බලන්න." යැයි කියමින් වාහනයෙන් එළියට බැස්සේ ය.

මා බොහෝ දුර බැහැර ගමන් ගත් අයෙක් නොවෙමි. ස්වභාව සෞන්දර්යයේ පහස නොලද්දෙක්මි. එහෙත් මා පළමු වරට දුටු මේ දසුන මගේ උදුරා රැගෙන ගොස් තිබූ බව නිසැක ය. ගණන් කළ නොහැකි තරම් කඳු පන්ති රැසකි. ඒ කඳු අතරින් අපට වඩාත් ළඟින් තිබුණු කන්ද පාමුල වෙල් යායකි. එක යායට හරි අපූරුවට ඒ කුඹුරු ඇදී තිබුණු අයුරින් මට චෙස් බෝඩයේ හතරැස් කොටු මතක් වුණි. ඈතින් පිහිටා තිබුණු කන්දකින් මට ජල පහරක් ගලා හැලෙනා අයුරු පෙනුණි. අදහා ගත නොහැකි ය. එය දිය ඇල්ලක් බව මා අසා දැන ගතිමි.

සතර දෙසටම නෙත් යොමු කරමින් කඳු පන්ති අතරින් පෙනුණු අපූරු දසුන් දෙස  බලමින් සිටි මට එක්වරම දාගැබක් කිරි පාටන් බබළන අයුරු පෙනුණි.

කුඩා ගොඩනැගිලි කිහිපයක් කඳු අතරින් පෙනුණු නමුත් යෝධ වෘක්ෂලතාවෝ ඒවා සඟවා දැමූහ. එබැවින් ගැමි පරිසරයට ඔබ්නා වූ චමත්කාරයක් එහි විය. සුළු මොහොතක් එවන් දසුනකට වහ වැටී සිටි මට අපි පිටත් වන්නෙ කොහෙට දෝ යන්නත් අමතක විය.

කෙසේ වෙතත් ඒ මොහොතේ මා තුළ මෙතරම් වේලාවක් නොතිබුනු කුතුහලයක් උනන්දුවක්  ඇති වුණි. රුවන්ගේ නිවසට අපි අද සැවොම එක්වර එකට පිටත් වුවත් මා හට එහි නැවතීමට වන්නේ මගේ පවුලේ කිසිවෙකු නොමැතිව යි.එයට හේතුව නම් අක්කාගේ පාසල් මිතුරියන් සහ ඔවුන්ගේ පවුලේ අයත් සමග දින පහක චාරිකාවක් යාමට අක්කාටත් අම්මාටත් තාත්තාටත් සිදු වීම යි. එය බොහෝ කාලයක සිට බලාපොරොත්තුවෙන් සිටි ගමනකි. මාවත් එම ගමන රැගෙන යාමට නිවැසියෝ බලාපොරොත්තු වූවත් මා තුළ නම් ඊට වැඩි කැමැත්තක් නොතිබුණි. ඒ මා සමග කතා බහ කිරීමටවත් ඔවුන් අතර මා හඳුනන යහළුවන් නොසිටි නිසා යි.

යලි යලිත් වංගු සහිත මාර්ගවල කෙටි දුරක් ගමන් ගත් අපි එක්වරම කුඩා අතුරු පාරක් වෙතට වාහනය හැරවූවෙමු.

" තාත්තා අපි දැන් රුවන්ලගේ ගෙදරට ළඟයිද ?"

" තව පොඩ්ඩ දුරයි පුතා "

" අපි කොළඹ වෙලත් තාත්තා කොහොමද මෙච්චර මේ පාරවල් ගැන දන්නේ?"

"රුවන්ලගේ තාත්තයි මායි ඉස්සර ඉඳලා ම හොඳම යාළුවො නේ. ඉතින් ඉස්සර මම නිතරම මෙහෙ යනවා එනවා"

එයින් මට තවදුරටත් තහවුරු වූයේ අපේ තාත්තා සහ රුවන්ලාගේ තාත්තා

හැබැවටම හොඳම යාලුවන් බවයි. කොළඹ වගේ නිවාස සංකීර්ණ වලින් තොර වූ මෙම ප්‍රදේශය කතන්දර පොත් වල කියන ආකාරයේ ගැමි පරිසරයක ලක්ෂණ විදහා පෑවේය. එක එක ආකාරයේ එකම වර්ගය නිවාස පේලි පහු කරමින් ගිය අපිට දැකගත හැකි වූයේ එක් එක් නිවසට විශාල වතු අයිති වී තිබෙන ආකාරයයි. මෙසේ ගමන් ගත් අපි තාත්තා කියූ ආකාරයටම පොඩි දුරක් ගමන් කර එක්තරා නිවසක් වෙතට වාහනය ඇතුළු කළෙමු.

මා සිතුවා සීයට සීයක් නිවැරදි බව මා තේරුම් ගත්තේ  අපි වාහනේ ඇතුළු කළ නිවසේ සිට රුවන්ලාගේ තාත්තා පිටතට පැමිණෙනවාත් සමඟයි. මට පාලනය කරගත නොහැකි තරම් චමත්කාරජනක කුතුහලයකුත් සිනහවකුත් පහළ විය. රුවන්ගේ අම්මා සහ නංගී පසෙකින් සිටිනවා මම දුටුවෙමි. කොහෙද රුවන්?  ගෙදර වත්ත පැත්තේ සිට රුවන් පාපැදියක් රැගෙන ඔවුන්ගේ නිවස වෙත ආවේය. ඉන්පසු අපිව සාදරයෙන් පිළිගත් රුවන්ගේ පවුලේ අය නිවස තුළට අපිට ආරාධනා කළහ.  කට්ටිය හෙමින් හිමින් ගේ ඇතුලට යන අතරතුරේදී  මම රුවන් සමඟ හරබර කතාවකට වැටුනෙමි.

" රුවන්, ඔයා දැනන් හිටියද අපි ඔයාලගෙ ගෙදර එනවා කියලා?"

" හ්ම්...ඔව්"

" ඇයි මට ඒ ගැන කිව්වේ නැත්තේ?"

" කොහොමත් ඉතින් ඔයා හෙට එන එක නේ කියලා හිතිච්ච නිසා,  මං කියන්න ගියේ නෑ. ඔයාව පුදුම කරන්නත් එක්ක මම පාඩුවේ හිටියා."

මම රුවන්ටම අදහසක් පෑවෙමි. ඔහුත් පෙරළා මා හට සිනහ වූවේ ය. තේ පැන් සංග්‍රහයකින් අපිට සංග්‍රහ කළ ඔවුන් අපිට දිවා ආහාරයෙන් ද සංග්‍රහ කළහ.

දිවා ආහාරයෙන් පසුව අපගේ අම්මාත් රුවන්ගේ අම්මාත් රුවන්ගේ නංගීත් මගේ අක්කාත් සමගින් කතාකතාබහ කරමින් සිටියහ. තාත්තලා දෙන්නා වෙනම කතාවක සිටි අතර මම වාහනේ තිබුණු මගේ ඇඳුම් බෑගය රුවන්ගේ කාමරය වෙත රැගෙන ගියෙමි. රුවන්ගේ කාමරයේ මටත් ඔහුටත් ඇඳවල් දෙකක් වෙන්කර තිබුණි. රුවන් මාහට ආගන්තුකයන් වෙත පිරිනමන ඇඳ පෙන්නුවේ ය.ඒ ඇඳ උඩින් මගේ බෑගය තැබූ මම රුවනුත් සමඟින් ඔහුගේ කාමරයෙන් පිටතට පැමිණියෙමි. ඒ අම්මා මට කතා කරනවා ඇසුණු බැවිනි.

" පුතා එහෙනම් අපි දැන් යන්නම්"  අම්මා යාන්තමෙන් මගේ ඔලුව අතගෑවා ය.

"ඔන්න යාළුව එක්ක දඟ වැඩ එහෙම කරන්නේ නෑ.. තේරුණාද ! " තාත්තා මගේ පිටට තට්ටුවක් දමමින් පොඩි තරවටුවක් කලේය.

"හරි හරි ඒවා කොහෙද මාත් එක්ක" රුවන්ලාගේ තාත්තා සිනහ වෙමින් පැවසුවේ ය.

"එහෙනම් මල්ලි අපි යනවා යනවා පරෙස්සමෙන් ඉන්න ඕන"අම්මා වගේම අක්කාත් මගේ ඔලුව අත ගෑවාය.

ඉන්පසු අම්මාටත් තාත්තාටත් මම වැන්දෙමි. ඔවුන් වාහනයට ගොඩවෙත්ම මගේ උගුර සිරවෙන ගතියක් මා හට දැනුණි.ඒ ඔවුන්ගෙන් දුරස් වී සිටිනවා පුරුදු නැති නිසා යි. ඒත් රුවන්ලාගේ ගෙදර කට්ටිය මා හට ඔවුන්ගේම ගෙදර අයෙකුට මෙන් සලකන්නට පටන් ගත්තේ ඒ මොහොතේ සිටන්ම ය. එම නිසාවෙන් ඒ නුපුරුදු ගතිය මාගේ සිත තුළින් තුරන් වී ගියේ ය. කෙමෙන් කෙමෙන් රෑ බෝවීගෙන එමින් තිබුණු අතර රුවන් රුවන්ගේ අල්මාරියේ එක් පසෙක මගේ ඇඳුම් ටික අඩුක්කිරීමට උදව් කළේ ය.

"අයියා බුදුන් වඳින්න එන්න. මම ඔක්කොම ලෑස්ති කරලයි තියෙන්නේ"

" ආ හරි හරි ඉන්න මං එනවා"

"රුවන් ඔයාලා හවසට බුදුන් වදිනවද?"

"ග්ම්..ඔව්... ඇයි නවීන් මීට කලින් හවසට බුදුන් වැඳලා නැද්ද?"

" අනේ නෑ රුවන්.තාත්තල එහෙම හවසට වැඩ ඇරල එද්දිත් වෙලා යනවනේ.  මීට කලින් නම් මං හවසට බුදුන් වැඳලා නෑ."

" හරි එහෙනම් අද යංකෝ ‘’

රුවන්ලාත් සමඟින් අපූරු අත්දැකීමක් ලද මම පළමුවරට හවස බුදුන් වැන්දෙමි. වැඩි විශේෂයක් නොවී ඉතිරි පැය කිහිපය ගෙවී ගියේය. රාත්‍රි ආහාරයත් රැගෙන මම මේ මොහොතේ ඔබ වෙත මේ මහතලාවේ නිවාඩුව ගත කළ පළමු දිනය පිළිබඳව විස්තරේ ගෙන ආවෙමි. හිදින් මේ පරිච්ඡේදයත් මෙතනින් නිමා කරමි.

සංක්ෂිප්තයක් ලෙසින් මේ මාසය පුරාවටම මා දුටු චමත්කාරජනක අත්දැකීම් ලැබූ ස්ථාන සියල්ල පහත පරිදි ඔබ වෙත ගෙන එන්නෙමි.

01.බලකඩුව

02.බලකඩුව සානුව පෙදෙසින් පෙනෙන සුන්දර දර්ශනය

03.තැන්නේ හංදිය

04.ඇයගේ වූ වෙල් යාය

05. නොනවතින දිගු හෙල් යායකින් වටවුණු මහතලා පුරවරය

06.අලගුමලේ කඳු පන්තිය

07. අලගුමලේ කන්ද ඉස්සර කැලෑවක්!

08. ඈතින් පෙනෙන කන්දේ තැනිතලාව

09. රතු මල් පිපුන ගස් කිහිපය සහ පයිනස් ගස්

10. හවසට සරුංගල් යවා කරන පණිවිඩ හුවමාරුව

11. දම් පාට නිල්පාට රෝස තැඹිලි අහස

12. අගලවත්ත ග්රාමයේ පුරාවෘත්තය

13. බ්රාහ්මණ ඇළ

14. තඹාගල ළිඳ

15. ගස් අතරින් පෙනෙන පුංචි ලී ගෙදර

16. ගෙදරට පෙනෙන නොනවතින කඳු වළල්ල

17.දුම්රිය නැවතුම්පොළ

18. ගෙදරට උදේ හයට ඇසෙන කෝච්චි හඬ

*කෙටි සටහනක් තබමි.*

**මා විසින් ඔබ ඔබ වෙත ගෙන නා මේ කතාන්දරය රුවන් දුටුවේය.ඒ මොහොතේ පටන් ඔහු ඒ වෙත වැඩි නැඹුරු තාවයක් දක්වමින් මා සමග වැඩි කතා බහක් ද නොකොට එය කියවීමට පටන් ගෙන ඇත. තවද රුවන්ගෙ නැගණියත් මීට සම්මාදම් වීම නිසාවෙන් මා ඔබට මහතලාවේ නිවාඩුව ගත කළ සම්පූර්ණ විස්තරය පිළිබඳව පසුව සඳහන් කරන්නෙමි. මහතලාවේ නිවාඩුවේ පූර්ණ කතන්දරය මේ පොතින් ඔබ වෙත ගෙන ඒමට නොහැකි වුවත්, හැකි තරමක් මෙහි සඳහන් කරන්නෙමි. මහතලාවේ චාරිකාවේ දෙවෙනි අදියරින් හමුවෙමු.**

## *වෙල් යායේ සරදම් කළ සොඳුරු මතක...*

- **රුවනුත් මමත් ඔවුන් එනතුරු බලා සිටි අයුරු**



❖ අස්වැන්න නෙලන්නට පැමිණි කාගේත් සිත් ගත් රූමතිය



❖ **මහතලා පුර යාත්‍රාව සුන්දර, මනස්කාන්ත සහ චමත්කාරජනක වීමට හේතු වූ අපූරු ස්ථාන කෙටියෙන් ඔබ වෙත...**



***ඇතැම් මතක කිසිදා හදවතෙන් නොමැකෙනු ඇත මිතුර!***

**නිමි.**

**(දෙවන අදියරින් හමුවෙමු )**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්